PSC/DIS/01/08/
2020-03-09

2025.07.

සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලු පළාත් ප්‍රධාන ලේකම්වරු
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව

**දූෂණ විරෝධී පනත යටතේ හෝ අල්ලස් පනත යටතේ වන වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් හෝ නඩු පවරා ඇති රජයේ නිලධාරීන්ට එරෙහිව පැවැත්වෙන මූලික විමර්ශන සහ විධිමත් විනය පරීක්ෂණ සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරීන් සාක්ෂි ලබා දීම සඳහා කැඳවීම.**

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ වන වැරදි සම්බන්ධයෙන් හෝ අල්ලස් පනත යටතේ වන වැරදි සම්බන්ධයෙන් නඩු පවරා අත්අඩංගුවට ගෙන හෝ නඩු පවරා ඇති රාජ්‍ය නිලධාරීන් සම්බන්ධයෙන් මූලික විමර්ශනයන් හෝ විධිමත් විනය පරීක්ෂණයන් සිදුකිරීමේදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් සාක්ෂිකරුවන් ලෙස ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම මූලික විමර්ශන හා විධිමත් විනය පරීක්ෂණයන් අවසන් කිරීමට නොහැකි වීම සම්බන්ධයෙන් සලකා බැලූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, 2025 මැයි 20 වන දින පවත්වන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මාසික රැස්වීමේදී පහත තීරණයන්ට එළඹ ඇති බව, එම කොමිෂන් සභාවේ අංක DG/RS/165/2025 සහ 2025.06.12 දිනැති ලිපිය මඟින් මා වෙත දන්වා ඇත.

I. අදාළ නිලධාරියාට එරෙහිව අධිකරණයේ පවරා ඇති නඩු කටයුතු අවසන් වීම හෝ එම අධිකරණයේ පැවැත්වෙන නඩු විභාගයේදී අදාළ විමර්ශන නිලධාරීන් සාක්ෂි ලබා දී තිබේද යන්න නොසලකා මූලික විමර්ශන සහ විධිමත් විනය පරීක්ෂණ සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරීන් සහභාගී කරවීමට.

II. කෙසේ වුවද, අදාළ විමර්ශන නිලධාරීන් අධිකරණයේ පැවැත්වෙන නඩු විභාගයේදී සාක්ෂි ලබාදීමට පෙර හෝ අදාළ නඩු විභාගය අවසාන වීමට පෙර විමර්ශන නිලධාරීන් මූලික විමර්ශනය සඳහා හෝ විධිමත් විනය පරීක්ෂණය සඳහා ඉදිරිපත් කිරීමෙන් අධිකරණයේ පැවැත්වෙන නඩු විභාගයට අගතියක් සිදුවිය හැකි බව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ

අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන්නේ නම්, එවැනි අවස්ථාවක නඩු විභාගය අවසානයේදී හෝ අදාළ විමර්ශන නිලධාරියා නඩුවේ සාක්ෂිකරුවෙකු ලෙස කැඳවීමෙන් පසුව හෝ මූලික විමර්ශන හෝ විධිමත් විනය පරීක්ෂණය සඳහා සහභාගී කරවීමට.

02. ඒ අනුව, එම කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් මූලික විමර්ශන හෝ විධිමත් විනය පරීක්ෂණ සඳහා සාක්ෂිකරුවන් ලෙස ඉදිරිපත් කිරීමට ඉල්ලීම් කිරීමේදී පහත තොරතුරු සමඟ අදාළ ඉල්ලීම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

1) විනය පරීක්ෂණයට භාජනය වන නිලධාරියාගේ නම.
2) ඔහුට එරෙහිව පවරා ඇති නඩුව සම්බන්ධයෙන් වන නඩු අංකය සහ වෙනත් විස්තර.
3) සාක්ෂිකරුවන් ලෙස කැඳවීමට අපේක්ෂා කරන විමර්ශන නිලධාරීන්ගේ නම.
4) එම විමර්ශන නිලධාරීන් සාක්ෂිකරුවන් ලෙස කැඳවීමේදී ඔවුන් මාර්ගයෙන් යම් ලේඛන ඉදිරිපත් කළයුතු නම් එම ලේඛන.

03. ඒ අනුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් සාක්ෂිකරුවන් ලෙස කැඳවීමට කරනු ලබන ඉල්ලීම්වලදී එම ඉල්ලීම් අදාළ මූලික පරීක්ෂණය හෝ විධිමත් විනය පරීක්ෂණය පැවැත්වීමට නියම කර ඇති දිනට අවම වශයෙන් දින 14කට පෙර අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු බවත්, එසේ ඉල්ලා සිටින නිලධාරීන් සම්බන්ධයෙන් හෝ එම නිලධාරීන් සහභාගී වීම පිළිබඳව යම් විමසීමක් සිදු කිරීමට තිබේ නම්, පහත සඳහන් දුරකථන අංකය, ෆැක්ස් අංකය හෝ ඊ මේල් මඟින් තොරතුරු විමසීම් කළ හැකි වන බවත් එම කොමිෂන් සභාව විසින් වැඩිදුරටත් දන්වා ඇත.

දුරකථන අංකය : 0112-596365
ෆැක්ස් අංකය : 0112-595045
ඊ මේල් : ciaboc-dgma@ciaboc.gov.lk

05. ඒ අනුව, මගේ සමාංක සහ 2023.05.03 දිනැති ලිපිය මෙයින් අවලංගු කරන අතර, ඉහත දන්වා ඇති පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**පිටපත:** අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ඔබගේ අංක DG/RS/165/2025 හා 2025.06.12 දිනැති ලිපිය අනුව කරු. දැ.ගැ.ස.